

# අපේ සිනමාව හා ටෙලි නාට්‍යය වල්මත් වෙලා ද ...?

## සිංහළ කලාව බේරා ගත හැකිද ?

විජයසිරි තිලකුමාර බ්‍රිස්බේන්

සිංහළ කලාව ගමන් කරමින් සිටිනුයේ කුමන දිශාවකටදැයි දැන් දැන් හතු පිපෙන්නාක් මෙන් බිහිවන ටෙලි නාට්‍ය හා ජනප්‍රිය චිත්‍රපට විමසිල්ලෙන් බලන ඔනෑම පුහුදුන් නොවන මිනිසකුට තේරුම් යනු ඇතැයි මගේ විශ්වාසයයි. මා කියන්නට සැරසෙන්නේ කුමක්දැයි විමසන්නට පෙර, මා දන්නා අයුරු සිංහළ කලාව ගැන කෙටි සටහනක් කිරීමට අවසර දුන මැනවි.

එදා දෙමළ චිත්‍රපට වල ආභාෂය ලබමින් බිහිවු සෑම සිංහළ චිත්‍රපටියක්ම මනඃකල්පිත ලෝකයක සහ නොගැඹුරු මානසික තලයක පිහිටි බව රහසක් නොවේ. තමා නිරන්තරයෙන් විඳින පීවිතයේ දහසකුත් වද වේදනා අමතක කර, මඳක් හෝ සහනයක් ලබනු පිණිස එම මනඃකල්පිත ලෝකයේ මොහොතකට රැ දෙනු පිණිස සුඛාන්තයකින් යුතු එවන් චිත්‍රපටියක් බලා සාමාන්‍ය ජනතාව සැනසුන අතර පීවිතය ගැන ගැඹුරට සිතන්නට ඔවුනට දැනුමක් හෝ අවස්ථාවක් නොතිබුනි. සියල්ලටම වඩා මෙවන් චිත්‍රපටි තුලින්, සාමාන්‍ය ජනතාව තම පීවිතය වටා ඇති අසරණ බවට සාධක වන මූලාශ්‍රය තේරුම් ගැනීම වැලක්වූ අතර, චිත්‍රපටියක මෙන් තම පීවිතය කවදා හෝ සුඛාන්තයකින් කෙලවර වනු ඇතැයි යන බලාපොරොත්තුවෙන් කල් හැරීය. මෙම හැඟීම් ඔවුනට පීවිතයේ යථාර්ථය දැකීමට රුකුලක් නොදුන් අතර ඔවුන්ගේ ආරථික හා සමාජමය අපගමණයට හේතු භූත විය.

මේ නොගැඹුරු මානසික තලයෙන් මිදුන ලෝකයකට ජනතාව ගෙන යාමේ කාර්ය භාරයට මුල්වන තාත්වික කලාව බිහිකිරීමේ ගෞරවය හිමිවන කලා කෘතීන් බිහිකිරීමේ ලා මාර්ටින් වික්‍රමසිංහ, ටී.බී. ඉලංගරත්න සහ පේරාදෙණි ගුරුකුලය පමණක් නොව තරමකට හෝ කරුණාසේන ජයලත් ද අගය කල යුතුය. ඔවුන් ගේ කලා කෘතීන් ගේ ආසන්නම ඵලය වූයේ ලෙස්ටර් ජේම්ස් පීරිස් අතින් බිහිවූ තාත්වික සිනමා කරණය බව අවිවාදයෙන් පිලිගැනෙනු ඇතැයි මගේ විශ්වාසයයි.

මෙය ලංකාවේ පමණක් හටගත් අහඹු සිදුවීමක් නොව, දෙවන ලෝක සංග්‍රාමයට පෙර පටන් ඉදිරියට ආ ප්‍රංශ හා ඉතාලි සිනමාවේ ඇතිවුන තාත්වික වාදී සිනමා රැල්ලේ නැඹුරුවයි. පමාවී හෝ 1960 දශකය තුල ලංකාවට ඇදී ආ එම රැල්ල තුලින්, තාත්වික කලාවේ අර්'ථය වූ කලාව තුලින් පීවිතයේ තාත්වික බව මතුකර පෙන්වීම, මාර්ටින් වික්‍රමසිංහයන් ගේ අපේ ගම, ටී.බී. ඉලංගරත්නයන්ගේ විලම්බීත සහ එදිරිවීර සරච්චන්ද්‍ර සහ ගුණදාස අමරසේකර යන්ගේ බොහෝ කෘතීන් තුල නිබඳව දැකිය හැක. සිංහල නව කථාව හා කෙටි කථාව තුල සිදුවූ එම සාහිත්‍යමය ඉදිරිගමන සිනමාව තුලට ගෙන ඒ මේ ගෞරවය ලෙස්ටර්' ජේම්ස් පීරිස්ට හිමිවන බව මගේ විශ්වාසයයි.

මෙලෙස බිහිවූ තාත්වික සිංහල සිනමාව, සිනමාවේ ඉදිරි ගමනේ අවසානය නොවන අතර එය තවදුරටත් විකාශණය වෙමින් යථාර්ථවාදී සිනමාව කරා ගමන් කලයුතුව තිබින. එහෙත් සමාජ ආර්ථික පෙරලියේ අතුරු ඵලයක් ලෙස අද සිදුවෙමින් පවතින්නේ කුමක්ද. යථාර්ථවාදී සිනමාව කරා ගමන් කිරීම කෙසේවෙතත්, තාත්වික සිනමාවත් අපට අහිමි කරමින් මනඃකල්පිත කසි කබල් හිංදි සිනමාව අනුකරණය කරමින් අපි ආපසු ගමන් කරමින් සිටිමු.

මෙහිදී හිංදි සිනමාව ගැනද වචනයක් කිවයුතුය. නොඑසේනම් එය ඉන්දියානු සිනමාවට කරන අගෞරවයකි. පාතර්' පංචලී මැවූ සත්‍යජිත් රායි වැනි උත්තරීතර සිනමාකරුවන් බිහිකල ඉන්දියානු සිනමාව ගරා වැටෙමින් ඇත්තේද ? නැත, ඔවුන් ඉදිරිය කරා ගමන් කරමින් සිටී. අවාසනාවකට, ලාංකික අපි වැලඳගෙන ඇත්තේ හිංදි සිනමාවේ සුපර් මෑන් වැනි වීරයන් සහ ඔවුන් දුප්පත් කම ක්ෂණයකින් පරදවා පොහොසත් වන අයුරුත්, දුෂ්ඨ ඉඩම් හිමියාගේ ලස්සණ දියණිය වසඟයට ගන්නා අයුරුත් පෙන්වන මනඃකල්පිත කසිකබල් නිර්මාණයන්ය. මෙම චිත්‍රපට බිහිකරණුයේ හුදෙක් නොගැඹුරු රසයත් සුඛාන්තයත් තම මිනුම් දණ්ඩ කරගත් ඉන්දියානු හා අවශේෂිත රටවල සිටින අවවර්'ධිත බුද්ධියෙන් යුතු පන්තියට බව අපේ බුද්ධිමතුන් හා පාලකයන්නටද නොරහසකි. මෙම චිත්‍රපට වල අනියම් ඵලය නම්, පීවිතය පුරා අපේ ජනතාව අතර පවතින දුප්පත් කමේ මූලය එම දුක්විඳින ජනතාව වටහා ගැනීම වැලකීමෙන් හෝ අතපසු කිරීමෙන් ඔවුන් එකම තලයේ සදා රඳවා තැබීමය, එසේ තැබීමෙන් වාසි ලබන්නෝද වෙති.
මෙහිදී පසක් කර ගත යුතු තවත් කරුණක් ඇත. 60-70 දශකයේ විශ්ව විද්‍යාලවලින් බිහිවූ තරුණ තරුණියෝ බොලඳ හිංදි සිනමා රසිකයන් බව කීමට ලැජ්ජාවූ අතර නූතන උපාධිධාරීන් ගෙන් වැඩි කොටසක් එම රසිකත්වය මෝස්තරයක් කරගෙන සිටී.
මෙයට හේතුව කුමක්දැයි සිතන විට මා මතකයට නැගෙන්නේ මහාචාර්ය ජේ. බී. දිසානායක, මෙම හිංදි ඇම්ම නූතන තරුණ තරුණියන්ට බෝවෙමින් පැවතුන 80 දශකයේ පෙර භාගයේදී ලංකාදීප පුවත්පතට ලියූ ලිපියකි. එතුමා විග්‍රහ කල අයුරු මිනිසාට අත්‍යවශ්‍ය ගුණාංගයක් වන්නේ බුද්ධියයි. බුද්ධිය ඇති තැනැත්තාට අධ්‍යාපණය ලබා ගත හැක. එහෙත් අධ්‍යාපණය ලැබූ පමණින් ප්‍රඥාව ඇති නොවේ. ප්‍රඥාව ලැබීමට බුද්ධිය අත්‍යවශ්‍ය වුවද අධ්‍යපණය අනිවාර්ය නොවේ. පාසල් හෝ විශ්ව විද්‍යාල අධ්‍යාපණය තුලින් ප්‍රඥාවන්තයන් අනිවාර්යයෙන්ම බිහිනොවන අතර එම අධ්‍යපණය ප්‍රඥාව ලබාගැනීමට රුකුලක් හා පහසුවක් පමණි. විශ්ව විද්‍යාල අධ්‍යපණය නොලත් ප්‍රඥාවන්තයන් කොතෙකුත් ඇති අතර අවාසනාවකට 60-70 දශකයෙන් පසුව විශ්ව විද්‍යාලවලින් බිහිවූ තරුණ තරුණියෝ බොහොමයකට ප්‍රඥාව ලැබී නැත. එසේනම් මිනිසා ප්‍රඥාව ලබාගන්නේ කෙසේද ? එය බුද්ධිමත් මිනිසා තමා වැඩෙන සමාජය, එම සමාජ සම්මතයන් හා එම සමාජය අගය කරණ සාහිත්‍ය කලා සරණිය තුලින් උකහා ගන්න ගුණාංගයකි. 70 දශකයේ අපර භාගයේ අපට සිටි නායකයෝ, සාහිත්‍ය කලා විෂයයන් වැදගැම්මක් නැති දේ බවට ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට තරම් නරුමවූ රටක, රූපවාහිණී වැනි මාධ්‍යයන් හරහා චොකා බයිලා ජනප්‍රිය කරවීමේ කාර්'ය භාරය නොපිරිහෙලා කරද්දී එම යුගයේ බිහිවූ තරුණ තරුණියෝ ගැඹුරු සාහිත්‍ය කලා අගයකරන්නට නොදැනීම ඔවුන්ගේ වරදක් නොවේ. මෙහිදී බයිලා සංස්කෘතිය පහත් ලෙස සැලකීමක් කිසිසේත්ම අදහස් නොකරමි. ප්‍රතුගීසින් හරහා අපට ලැබුන බයිලා සංස්කෘතිය අප සංස්කෘතියේම අංගයක් වී ඇති අතර, හුදෙක් තාවකාලික විනෝදාස්වාදයක් දෙන කලාවේ අංශයක් ලෙස අප එය අගය කලයුතුය. එහෙත් එයට වඩා ගැඹුරු අංගයක් කලාවේ ඇති බවත් එම අංගය සමූලඝාතනය කර, එම කලා අංශයේ කැපී පෙනුන විද්වතුන්ට පහර දීමත් ප්‍රඥාවන්ත පරපුරක් බිහිනොවීමේත් අද බිහිවී තිබෙන අවවර්ධිත පරපුරටත් වගකිවයුතු නොවේද? එය පහත්පෙලේ ඉන්දියානු සිනමා කලාවට දීනවීමේ ආරම්භයත්, සිංහළ කලාවේ අවසානයේ ආරම්භයත් ලෙස පසක් කර ගනිමි.

අපේ තරුණ පරපුර පමනක් නොව, සතර පෝයට සිල් ගන්නා වැඩිහිටි පරම්පරාවද මේ කසිකබල් හිංදි චිත්‍රපට හා එම චිත්‍රපට පෙරමුණ කරගත් ටෙලි නට්‍යවලට කෙතරම් වහල්වී ඇද්දයි දැනගනු වස් නිවාඩුවක් ගත කිරීමට ලංකාවට යාම පමණක් ප්‍රමාණවත්ය. සියලූ වැඩ අවසන් කර ටීවී ඉදිරියේ විපස'සනා භාවණාව වැඩීමට මෙන් හිඳගන්නා උපාසක උපාසිකාවෝ දකින ඔබේ සිත කම්පාවනු ඇත.
ලක්මවගේ අවාසනාවට මෙවන් කසිකබල් චිත්‍රපට හෝ ' අනුකරණීය ටෙලි නාට්‍යය නිර්'දය ලෙස විවේචනය කිරීමට ජයවිලාල් විලේගොඩලා අප අතර දැන් නැත. කාලය එලඹ ඇත. වහා මේ උවදුරින් පරම්පරා ගනානාවක් බේරා ගැනීමේ වගකීම ඔබ අප සැවොම සතුය. ■


We wish you
A Happy New Year 2006

From
CHINNY Phonecards

Customer Service: (02) 96599881

CHINNY
Your Telephony Gateway to Sri Lanka

All calls to Sri Lanka are through Sri Lanka Telecom

Sri Lanka Telecom

We Guarantee Top Voice Quality to Sri Lanka
Use a CHINNY CARD and see the difference